# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2472/21 - 2026 ජනවාරි මස 21 වැනි බදාදා - 2026.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත**

8(9) උප වගන්තිය යටතේ නිවේදනය

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(9) උපවගන්තිය අනුව පනතේ 7 වන වගන්තියෙහි සඳහන් මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම බලාත්මක කිරීම හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධාන පහත උපලේඛනයේ දැක්වෙන බව නිවේදනය කරමු.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2026 ජනවාරි මස 13 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

1A - PG 7485 — 48 (2026/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## උපලේඛනය

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4) උපවගන්තිය යටතේ දේශපාලන පක්ෂයක් වශයෙන් පිළිගැනීමට අදාළව එකී පනතේ 7 වැනි වගන්තියේ සඳහන් විධිවිධාන සම්බන්ධයෙන් එම පනතේ 8(9) උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන විධාන**

| *ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව ඉදිරිපත් කළ යුතු ලේඛන* | | *නිර්ණායක* |
|---|---|---|
| **1.** පක්ෂ ව්‍යවස්ථාව | 1.1. | මෙම *ගැසට්* පත්‍රයේ ඇමුණුම 01හි දේශපාලන පක්ෂ ව්‍යවස්ථා සැකසීමට අදාළ නිර්ණායක ඉදිරිපත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශය දක්වා ඇත. ඒ අනුව පිළිගැනීම සඳහා අයදුම් කරන දේශපාලන පක්ෂයක ව්‍යවස්ථාව අදාළ කරුණු ඇතුළත් කර සකස් කර තිබිය යුතු ය. |
| **2.** නිලධාරි මණ්ඩලය | 2.1. | අයදුම් කරන දිනට පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් සියළු තනතුරු සඳහා නිලධාරින් පත්කර තිබිය යුතු ය. |
| | 2.2. | දේශපාලන පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් වන ප්‍රධාන තනතුරු අතරින් අවම වශයෙන් එක් තනතුරක් සඳහා කාන්තා නියෝජනය සහතික විය යුතු ය. |
| | 2.3. | දේශපාලන පක්ෂ ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්ව වර්ෂ 4ක කාලයක් තුළ නිලධාරි මණ්ඩල තුළ කාන්තා නියෝජනය අදාළ වසර හතර තුළම ඇති බවට තහවුරු කර තිබිය යුතු ය. |
| | 2.4. | සන්ධානගතවීමකින් තොරව පක්ෂ නිලධාරි මණ්ඩලය තුළ වෙනත් පක්ෂ නියෝජනය කරන නිලධාරින්/සාමාජිකයින් සිටී නම් ඔවුන් සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර තිබිය යුතු ය. |
| **3.** විගණනය කරන ලද ගිණුම් වාර්තා | 3.1. | පක්ෂ ලියාපදිංචිය සඳහා අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්ව වසර 4ක කාලය සඳහා විගණනය කරන ලද විගණිත ගිණුම් ප්‍රකාශ ලබා දී තිබිය යුතු ය. එම විගණිත ගිණුම් ප්‍රකාශ දෙසැම්බර් මස 31 අවසන් වන වසරක කාලයකට හෝ මාර්තු 31 අවසන්වන වසරක කාලයකට අයත් විය යුතු ය. |
| | 3.2 | විගණන මතය ලෙස සලකනු ලබන්නේ දේශපාලන පක්ෂයේ ආදායම් වියදම් හා වත්කම් බැරකම් පරීක්ෂා කර බලා එය නිවැරදිව සිදු කර ඇති බවට ලියාපදිංචි විගණකවරයෙකු විසින් සනාථ කිරීමයි. මෙම විගණන වාර්තා පක්ෂයේ භාණ්ඩාගාරික /ලේකම්/සභාපති යන තනතුරුවලින් අවම වශයෙන් දෙදෙනෙකු විසින්වත් සනාථ කර තිබිය යුතුය. විගණන ප්‍රමිතියට අනුකූලව ගිණුම් පවත්වාගෙන යන බවට විගණකවරයා විසින් සිය විගණන මතය, තම අත්සන සහ නිල මුද්‍රාව තබා සහතික කළ යුතු ය. |
| | 3.3. | අවසන් වර්ෂයට අදාළ විගණන ගිණුම් ප්‍රකාශය අවසන් කර නොමැති නම් ඒ බව දැනුම්දිය යුතු අතර අවසන් කළ වහාම කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවත් ඉල්ලුම් කරන පක්ෂය සම්මුඛ පරීක්ෂණයට කැඳවන අවස්ථාව වන විට ඉහත උපදෙස් පරිදි සකස් කළ අවසන් ගිණුම් ප්‍රකාශය අනිවාර්යෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. |
| **4.** පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය | 4.1. | දේශපාලන පක්ෂ ව්‍යවස්ථාවේ දක්වා ඇති අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සකස් කළ ප්‍රතිපත්ති ප්‍රකාශයක් වීම අත්‍යාවශ්‍ය වේ. එම ප්‍රතිපත්ති ප්‍රකාශය අයදුම්පත සමග වෙනමම ලේඛනයක් ලෙස ඉදිරිපත් කළ යුතුය. |
| | 4.2. | ප්‍රතිපත්ති ප්‍රකාශය පක්ෂයේ මධ්‍යම කාරක සභාව/නිලධාරි මණ්ඩලය විසින් සරල බහුතරයෙන් අනුමත කර තිබිය යුතුය. අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුමත කළ රැස්වීම් වාර්තා හා අත්සන් ලේඛන ද එම ප්‍රතිපත්ති ප්‍රකාශය සමග ඉදිරිපත් කළ යුතුය. |

**5. දේශපාලන පක්ෂයේ නම**

5.1. ඉල්ලුම් කරන පක්ෂයේ නම පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස දැනටමත් පිළිගත් පක්ෂයක නමකට සමාන නොවීම හෝ නොමඟ යැවීමට ව්‍යාකූල කිරීමක් හෝ මුල පිරීමට හේතු වන තරමට ඒ දේශපාලන පක්ෂයේ නම එසේ හිමිකම ලැබී ඇති පක්ෂයේ නමට සමාන නොවිය යුතු ය. මැතිවරණ කොමිෂන් සභාව විසින් නමේ සමානත්වය පිළිබඳව තීරණය කරනු ඇත.

**6. දේශපාලන ක්‍රියාකාරකම්**

6.1. මූලික වශයෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ඡන්ද බලය, නීතියේ ආධිපත්‍ය සුරැකීම හා මහජනයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් සක්‍රීයව දායක වූ දේශපාලන ක්‍රියාකාරකම් ඉටුකොට තිබිය යුතුය.

6.2. දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසන් දිනට පෙර වසර 4ක කාලයක් තුළ දේශපාලන ක්‍රියාකාරකම්වල නිරතව තිබිය යුතුය. එම වසර 4 තුළදී එක් එක් වර්ෂයකදී දේශපාලන ක්‍රියාකාරකම් 5ක් බැගින්වත් ඉටුකොට තිබිය යුතු අතර, එකී එක් එක් දේශපාලන ක්‍රියාකාරකම් පහ අතරින් අවම වශයෙන් දේශපාලන ක්‍රියාකාරකම් දෙකක් **ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකම් විය යුතු ය.**

**6.2.1 ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකම්**

6.2.1.1 දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති දේශපාලන පක්ෂ සිව් වසරක කාලසීමාව තුළ ස්වාධීනව හෝ වෙනත් පිළිගත් දේශපාලන පක්ෂයක් සමඟ සන්ධානගතව සිය අපේක්ෂකයන් ඉදිරිපත් කර මැතිවරණයක් සඳහා ස්වාධීනව තරග කර තිබිය යුතු ය. ඒ බව සනාථ කිරීම සඳහා,

- අදාළ පක්ෂ සමග ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම,
- මැතිවරණ කොමිෂන් සභාවට එලෙස තරග කරන බවට සන්ධානගත පක්ෂයේ ලේකම්වරයා එවා ඇති ලිපියේ පිටපතක් සහ ලබාගත් ඡන්ද ප්‍රතිඵල පිළිබඳ විස්තර.
- තරග කළ දිස්ත්‍රික්ක පළාත් පාලන ආයතනය හා තරග කළ අපේක්ෂකයාගේ හැඳුනුම්පත් අංකය, නම, දුරකථන අංකය හා ලිපිනය යන තොරතුරු අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

ඡන්ද විමසීම් කාලය අනුයාත වර්ෂ දෙකකට ඇතුළත් වන විට එම ඡන්ද විමසීමට තරග කිරීමේ කාර්යය වර්ෂ දෙක සඳහාම සැලකිල්ලට ගනු ලැබේ. එසේ වුවද වර්ෂ දෙකක සලකා බැලිය හැක්කේ තනිව හෝ සන්ධානගතව තරග කර ඇති බව නිශ්චිතව සනාථ වන්නේ නම් පමණි.

6.2.1.2 යම් දේශපාලන පක්ෂයක් යම් වර්ෂයක එහි වාර්ෂික සම්මේලන හා දිස්ත්‍රික් සම්මේලන පැවැත්වීම්, ශාඛා සමිති පිහිටුවීම් සිදුකර ඇත්නම් හා ඒ බව සනාථ වේ නම් අදාළ වර්ෂය තුළ ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ. එවා සනාථ කිරීම සඳහා අදාළ රැස්වීම් ශාඛා සමිති පිහිටුවීමේ,

- ඡායාරූප, වීඩියෝ පට,
- කැඳවීමේ ලිපි ලේඛන,
- රැස්වීම් වාර්තාව,
- සහභාගි වූ අයගේ නම, ලිපිනය, දුරකථන අංකය හා අදාළ ලේඛන,
- පැවැත්වූ ස්ථානය, දිනය, වේලාව යන තොරතුරු ලබාදිය යුතු ය.

6.2.1.3 දේශපාලන ක්‍රියාකාරකම් සිදු කරන යම් පක්ෂයක් ස්වකීය පක්ෂයේ ප්‍රතිපත්ති හා දේශපාලනමය ක්‍රියාකාරකම් ප්‍රචාරය සඳහා පසුගිය සිවු වසරක කාලය තුළ අඛණ්ඩව, පුවත්පත් හෝ සඟරා මුද්‍රණය කර තිබීම ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරමක් ලෙස සලකනු ලැබේ. එය සනාථ කිරීමට එම පුවත්පත් හා සඟරා අතරින් සහතික කළ පිටපත් ඉදිරිපත් කළ යුතු ය :

- අදාළ සඟරා හා පුවත්පත් පක්ෂ පිළිගැනීම සඳහා අයදුම් කරන අවසන් වසරට පමණක් අයත් ප්‍රකාශ නොවිය යුතු ය,

- අදාළ ලිපි ලේඛන පක්ෂ සාමාජිකයන් විසින් ඉදිරිපත් කර ඇත්නම් එම තොරතුරු ලබාදිය යුතු ය. තම පක්ෂය විසින් සිදු කරන ලද පක්ෂ ක්‍රියාකාරකම්වල තොරතුරු ඇතුළත්ව ඇත්නම් ඒ පිළිබඳව දැනුම්වත් කළ යුතු ය,
- පක්ෂ ප්‍රතිපත්ති හා සමානව ලිපි ඉදිරිපත් කර ඇත් ද යන්න පිළිබඳව තොරතුරු ඉදිරිපත් කළ යුතු ය.

6.2.1.4 අයදුම් කරන කාලයට අමතරව රට තුළ පැන නැගුණු දේශපාලන මතවාදය හෝ ජාතික හෝ සමාජ ප්‍රශ්නයක් පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවට පිළිගත හැකි පරිදි ජාතික වශයෙන් ඊට පක්ෂව හෝ විපක්ෂ විවිධ ක්‍රියාකාරකම්වල අදාළ වසර පුරා යෙදී තිබිය හැක.මේ සඳහා පක්ෂව හා විපක්ෂව කරන ලද කාර්යයන් පිළිබඳව හා එම කාර්යයන් පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කරමින් සනාථ කළ යුතු ය.

6.2.1.5 ජාතික වශයෙන් දිවයින පුරා අදාළ දේශපාලන පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශ, මූලධර්ම හා අදහස් ජනගත කිරීම සඳහා අඛණ්ඩ වැඩපිළිවෙලක් අදාළ වසර පුරා ක්‍රියාත්මක කර තිබීම ප්‍රමුඛ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සලකනු ලැබේ. ශාඛාසමිති සමාගම්, විවිධ ජන කණ්ඩායම්වලට දැනුම්වත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම, තරුණ, කාන්තා,වැඩිහිටි සමිති පිහිටුවීම පක්ෂයට අයත් එම සමිති සංගම්වල දේශපාලන ක්‍රියාකාරකම්වලට අදාළ තොරතුරු අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

**6.2.2.** වෙනත් දේශපාලන ක්‍රියාකාරකම්

6.2.2.1. රාජ්‍ය ප්‍රතිපත්තිවලට අදාළ පක්ෂ හෝ විපක්ෂ ක්‍රියාකාරකම් සඳහා සක්‍රීයව මැදිහත්වී තිබීම.

6.2.2.2. මහජන අයිතිවාසිකම් වෙනුවෙන් සක්‍රියව පෙනී සිටීම සඳහා වූ ක්‍රියාකාරකම් සිදුකර තිබීම.

6.2.2.3 රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ඡන්ද බලය, නීතියේ ආධිපත්‍ය සුරැකීම සඳහා හෝ කරනු ලබන විවිධ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම හෝ එයට අදාළ වෙනත් ක්‍රියාකාරකම් සිදුකර තිබීම.

6.2.2.4 රටේ පාලන බලය ලබා ගැනීමට අදාළව පක්ෂ ක්‍රියාකාරීන් හා ජනතාව දැනුවත් කිරීම සඳහා ක්‍රියාකාරකම් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම.

6.2.2.5 යම් ඡන්ද විමසීමක දී ජයග්‍රහණය කර ඇති අපේක්ෂකයන් එම පක්ෂය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාළ මහජන නියෝජිතායතනය තුළ ක්‍රියාකිරීම ද ඒ ඒ වර්ෂයට අදාළ ක්‍රියාකාරකම් ලෙස සලකනු ලැබේ.

6.2.2.6 යම් සංවිධානයක් ඒ හා බැඳි අනුබද්ධ වෘත්තීය, තරුණ, කාන්තා යනාදී සංවිධාන අඛණ්ඩව පවත්වාගෙන යමින් කටයුතු කරන්නේ නම් හා එම සංවිධාන අදාළ දේශපාලන පක්ෂය විසින් මෙහෙයවන බව සනාථ වේ නම් එකී කාර්යයන්.

6.2.2.7.ජාතික හෝ අන්තර්ජාතික වැදගත්කමකින් යුතු කරුණු සම්බන්ධයෙන් නිසි බලධාරීන් වෙත ලිඛිතව කරුණු දැක්වීම පමණක් පක්ෂ දේශපාලන ක්‍රියාකාරකම් ලෙස නොසැලකේ. එසේ වුවද එවැනි විවිධ කරුණුවල දී මෙවැනි ලිපි භාරදීම නිරතුරුව සිදු කිරීම ඒ ඒ වර්ෂය තුළ මාධ්‍ය නිවේදන නිකුත් කිරීම් සේ සලකා ක්‍රියාකරනු ලැබේ.

6.2.2.8 යම් සංවිධානයක් එක් වර්ෂයක දී පාරිසරික හෝ සමාජ සුභසාධක හෝ සමාජ සේවා හෝ වෘත්තීමය හෝ ක්‍රියාකාරකම් කිහිපයක් හා වෙනත් දේශපාලන ක්‍රියාකාරකම් ද සිදුකර ඇත්නම් වර්ෂය තුළ කරන ලද එකී පාරිසරික ක්‍රියාකාරකම් හෝ සුභසාධක ක්‍රියාකාරකම් හෝ සමාජ සේවා ක්‍රියාකාරකම් හෝ වෘත්තීමය ක්‍රියාකාරකම් ඒ වර්ෂයට අදාළව එක් දේශපාලනමය ක්‍රියාකාරකමක් ලෙස සැලකිය හැකිය. තව ද සෙසු දේශපාලන ක්‍රියාකාරකම් සමග මෙවැනි ක්ෂේත්‍ර කිහිපයක ක්‍රියාකාරකම් සිදුකර ඇති විටදී ඒ ඒ ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාකාරකම් ඒකාබද්ධ කොට ඒ ඒ ක්ෂේත්‍රය සඳහා වූ වෙන් වෙන් ක්‍රියාකාරකම් ලෙස සලකනු ලැබේ.

**6.2.3. පහත සඳහන් ක්‍රියාකාරකම් දේශපාලන ක්‍රියාකාරකම් සේ සලකනු නොලැබේ.**

6.2.3.1. වෙනත් දේශපාලන පක්ෂවල සංවත්සර උත්සව හා වාර්ෂික සම්මේලන සඳහා ආරාධනා ලැබීම හෝ සහභාගීවීම, රාජ්‍ය උත්සව හෝ රජයේ රැස්වීම්වලට හෝ සහභාගිවීම පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස නොසැලකේ.

6.2.3.2. පක්ෂයේ නමින් ඇති සමාජ ජාල පෞද්ගලික ගිණුම් හෝ සීමිත සමූහ හරහා පක්ෂයේ මතවාද ප්‍රචාරය කිරීම ඒ ඒ වර්ෂයට අදාළව දේශපාලනමය කාර්යයක් වන නමුදු, ප්‍රමුඛ දේශපාලනමය කාර්යයක් ලෙස නොසැලකේ. පක්ෂයේ ක්‍රියාකාරින්ගේ පෞද්ගලික නමින් පවත්වාගෙන යන සමාජ ජාල ගිණුම්වල සඳහන් කරුණු පක්ෂයේ ක්‍රියාකාරකම් පිළිබඳ සාක්ෂි ලෙස ලබා ගත හැකි නමුත්, එම පෞද්ගලික නමින් වන ගිණුම් පවත්වාගෙන යාම පක්ෂයේ දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සැලකිය නොහැක.

6.2.3.3. පක්ෂයේ යම් නිශ්චිත නායකයෙකු හෝ නිලධරයෙකු විසින් පක්ෂයේ නමින් විවිධ කරුණු සඳහා නිතිපතා මුද්‍රිත/විද්‍යුත් මාධ්‍ය හෝ සමාජ ජාල මගින් නිවේදන නිකුත් කිරීම හෝ මාධ්‍ය සාකච්ඡා නිරතුරුව පැවැත්වීම හෝ ඒ ඒ වර්ෂය සඳහා පක්ෂයේ එක් ක්‍රියාකාරකමක් ලෙස සැලකිය හැකි නමුත් මහජන සහභාගීත්වයකින් තොරව *නැතහොත්* භූමියේ කිසිදු ක්‍රියාකාරීත්වයක් නොමැතිව මාධ්‍ය නිවේදන නිකුත් කිරීම හෝ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම හෝ පමණක් සිදුකිරීම අඛණ්ඩ දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සලකනු නොලැබේ.

6.2.3.4. හුදෙක්ම පාරිසරික, ආගමික, සුභසාධක, සමාජසේවා, වෘත්තීය සමිති වැනි එක් ක්ෂේත්‍රයක් සඳහා පමණක්ම සංවිධානගත වූ සංවිධානවල එම විෂයට අදාළ ක්‍රියාකාරකම් පමණක් සිදුකිරීම අඛණ්ඩ දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සැලකිය නොහැකිය.

6.2.3.5 යම් සංවිධානයක් දේශපාලන ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස සමාජ සේවා කටයුතුවල හෝ සමාජ සුභසාධන ක්‍රියාකාරකම්වල හෝ පරිසර සුරැකීමේ කාර්යයන්හි නියැලීම ඉදිරිපත් කරන්නේ නම් එවැනි ක්‍රියාකාරකම් **මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකර නොමැත්තේ නම්** අවම වශයෙන් සම්පූර්ණ මැතිවරණ කොට්ඨාසයක් *නැතහොත්* පරිපාලන දිස්ත්‍රික්කයක් ම සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි එම කටයුතුවල යෙදී ඇත්නම් පමණක් එකී ක්‍රියාකාරකම් දේශපාලන ක්‍රියාකාරකම් ලෙස සලකා බැලීමේ හැකියාව ඇත. උදාහරණයක් වශයෙන් එක් මැතිවරණ කොට්ඨාසයක ගම් කිහිපයක් සඳහා පමණක් සමාජ සේවා කටයුතුවල යෙදීම දේශපාලන ක්‍රියාකාරකමක් ලෙස සැලකිය නොහැකිය.

6.3 මෙම දේශපාලන ක්‍රියාකාරකම් එක් එක් වර්ෂවලට අදාළව වෙන වෙනම සකස් කර ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

6.4 දේශපාලන ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාකාරකම, එම ක්‍රියාකාරකම සිදු කළ දිනය, ස්ථානය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

6.5 සමාජ ජාලා, විද්‍යුත් මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා කරන ලද ක්‍රියාකාරකම්වල තොරතුරු හඳුනා ගත හැකි ආකාරයට අදාළ සම්බන්ධතාවල තොරතුරු, වේලාව හා දිනය ලබා දිය යුතු යි.

**7. ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන**

7.1. මෙම *ගැසට්* පත්‍රයේ ඇමුණුම 02 හි දක්වා ඇති අදාළ අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කොට එම අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු පහත සඳහන් ලේඛන පක්ෂයේ ලේකම්වරයා විසින් අත්සන් කර අයදුම්පතට ඇමුණුම් ගතව වෙන වෙනම මැතිවරණ කොමිෂන් සභාව විසින් නිවේදනය කරන අවසන් දිනට ප්‍රථම මැතිවරණ කොමිෂන් සභාවට ලියාපදිංචි තැපෑලෙන් හෝ පක්ෂයේ ලේකම්වරයා විසින්ම ගෙනවිත් භාරදී භාරදුන් බවට නිකුත් කරන ලදුපත ලබාගත යුතු ය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පක්ෂ ලේකම්වරයා අත්සන් කොට තිබිය යුතු අතර ඒ සමග පහත ලේඛන පිටපත් දෙකකින් (02) ඉදිරිපත් කළ යුතු ය.

7.1.1 පක්ෂ ව්‍යවස්ථාව

7.1.2 පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ ලැයිස්තුව

7.1.3 පක්ෂයේ කාන්තා නිලධාරීන්ගේ නම් (පසුගිය වසර 04 ක)

7.1.4 පක්ෂයේ විගණනය කර ලද ගිණුම් ප්‍රකාශ (අයදුම්පත ඉදිරිපත් කරන වසරට පූර්ව වසර හතරක කාලය සඳහා)

7.1.6. පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය.

7.1.6 දේශපාලන පක්ෂයක් වශයෙන් ආසන්නතම වූ වසර හතරකවත් කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වූ බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි සියලුම ලිපි ලේඛන වෙන වෙනම ගොනු 04ක වර්ෂ අනුව බෙදා ඉදිරිපත් කළ යුතුය.

7.2. දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා අයදුම් කරන්නේ නම්,මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටින අවස්ථාවක දී ඉහත සියලුම ක්‍රියාකාරකම් සනාථ කිරීම සඳහා විධිමත් ලියකියවිලි/ වාර්තා ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

8. අසම්පූර්ණ අයදුම්පත් හා කොමිෂන් සභාව සෑහීමකට පත් නොවන ආකාරයට ඉදිරිපත් කර ඇති අයදුම්පත් සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ඇමුණුම 01**

**දේශපාලන පක්ෂ ව්‍යවස්ථා සැකසීමට අදාළ නිර්ණායක ඉදිරිපත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශය**

මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ නියාමනය සඳහා ඒකාබද්ධ රාමුවක් හඳුන්වාදීමේ අරමුණින් පහත සඳහන් මාර්ගෝපදේශ සියලුම පිළිගත් දේශපාලන පක්ෂ සඳහා ඉදිරිපත් කරනු ලැබේ. එමඟින් දේශපාලන පක්ෂවල අභ්‍යන්තර පාලනය විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා සහ පිළිගත් දේශපාලන පක්ෂයේ සෑම සාමාජිකයෙකුටම සම අවස්ථා සලසමින් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්මවලට අනුකූලවීම සඳහා ඒකාබද්ධ මගපෙන්වීමක් ඉදිරිපත් කරනු ලැබේ. මෙම මාර්ගෝපදේශ අනුගමනය කිරීම තුළින් දේශපාලන පක්ෂවලට එකී පක්ෂවල අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට, සෑමට <u>අවස්ථාව සැලසීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් කෙරෙහි මහජන විශ්වාසය වර්ධනය කිරීමට අවස්ථාව</u> සැලසේ.

**1.** <u>පක්ෂ ව්‍යවස්ථාව</u>

<u>නියත විධිවිධාන</u>

**1.1** <u>**පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය**</u>

සෑම පක්ෂයක් ම එම පක්ෂය පිළිගන්නා අවස්ථාවේ දී 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(ඇ) වගන්තිය අනුව පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටපතක් ලබාදිය යුතුබව සඳහන් වේ. බොහෝ පක්ෂ ව්‍යවස්ථාවල අරමුණු පරමාර්ථ වෙන් වෙන් වශයෙන් දක්නට ඇතත් පොදුවේ පක්ෂ ප්‍රතිපත්තිය දක්නට නොමැත. එම පක්ෂය නියෝජනය කරන අනුගාමිකයන් සඳහා අවබෝධ කර ගත හැකි පරිදි පැහැදිලිව සිය පක්ෂ ප්‍රතිපත්තිය පක්ෂ ව්‍යවස්ථාවේ ඇතුළත් කළ යුතු ය. මෙම පක්ෂ ප්‍රතිපත්තිය ජාති, කුල, ආගම් හා වර්ගවාදී භේදයන්ගෙන් තොර විය යුතු ය.

**1.2** <u>**අරමුණු**</u>

පක්ෂයේ දැක්ම මෙහෙවර සහ ඉලක්ක පැහැදිලිව දැක්වීම. පක්ෂ ප්‍රතිපත්තියට අනුකූලවන සේ පක්ෂයේ අරමුණු සහ අභිමතාර්ථයන් ද පැහැදිලිව ඊට ඇතුළත් කළ යුතු යි.

1.3 <u>**පක්ෂයේ නම**</u>

පක්ෂයේ නම සහ කෙටි නම භාෂා ත්‍රිත්වයෙන් (සිංහල,දෙමළ,ඉංග්‍රීසි) ඇතුළත් කළ යුතු ය.

1.4 <u>**සාමාජිකත්ව රෙගුලාසි**</u>

සාමාජිකයන් බඳවා ගැනීමේ සුදුසුකම් සහ සාමාජිකත්වය අවසන් කිරීමේ ක්‍රියාවලීන් පිළිබඳ විස්තර ඇතුළත් විය යුතු ය.

1.5 <u>**මූලික හරයන්**</u>

ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, මානව හිමිකම් සහ සමාජ සාධාරණත්වය සඳහා කැපවීම ආරක්ෂා වන අයුරින් සකස් විය යුතුය.

1.6 <u>**අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය**</u>

පක්ෂ නායකයින් සහ පක්ෂ සංවිධාන ව්‍යුහයේ තීරණ ගැනීමේ ඒකකය (විධායක මණ්ඩලය, දේශපාලන මණ්ඩලය, උත්තරීතර මණ්ඩලය)තෝරා ගැනිම සඳහා වන ක්‍රියාපටිපාටිය බහුතර කැමැත්තට අනුව සිදුකිරීම.

1.7 <u>**ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය**</u>

නායකත්වය සහ නාමයෝජනාවල නියෝජනය සඳහා සමාන අවස්ථා සඳහා බාධා ඇති නොකිරීම හා භේදයකින් තොරව අවස්ථා ප්‍රවර්ධනය කිරීම.

1.8 <u>**විනය ක්‍රියාවලීන්**</u>

දුක් ගැනවිලි ආරවුල් සහ විනය කටයුතු විධිමත් වන ලෙසට පැහැදිලි රාමුවක් හඳුන්වා දීම.

1.9 <u>**ආචාර ධර්ම සංග්‍රහය**</u>

සාමාජිකයින් සහ නායකයින් සඳහා සදාචාරාත්මක මාර්ගෝපදේශ සංග්‍රහගත කිරීම.

1.10 <u>**ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාපටිපාටිය**</u>

ව්‍යවස්ථා සංශෝධන පියවර පැහැදිලි කිරීම.පක්ෂ ව්‍යවස්ථාව පෞද්ගලික පරමාර්ථ මත සංශෝධනය කරන ප්‍රවනතාවයන් මග හැරිය යුතු ය. පක්ෂ ව්‍යවස්ථාවේ සංශෝධනය කළ හැකි සහ සංශෝධනය කළ නොහැකි කරුණු පැහැදිලිව සඳහන් කළ යුතුය. සංශෝධනයෙන් පසු මැතිවරණ කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු අතර, ව්‍යවස්ථා සංශෝධනය සඳහා බලය ඇති පක්ෂයේ සංවිධාන ව්‍යුහය හෝ නිලධරයා කවුරුන්ද යන්න සඳහන් කිරීම.

**2.** <u>**පක්ෂ ව්‍යුහය සහ සාමාජිකත්වය**</u>

2.1. <u>**පක්ෂයේ සංවිධාන ව්‍යුහය**</u>

දේශපාලන පක්ෂවල සංවිධාන ව්‍යුහය පැහැදිලිව තිබිය යුතු ය. සංවිධාන ව්‍යුහයේ ස්ථරයන් **ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලෙස (පක්ෂයට ආවේණික වෙනත් ක්‍රම ඇත්නම් ඒ අනුව)** වර්ග කර ඒවායේ **භූමිකාව, තීරණ ගැනීමේ ඒකකයන්** මෙන්ම **එක් එක් මට්ටමින් පවරා ඇති වගකීම්** පැහැදිලිව ඉදිරිපත් කර තිබිය යුතු ය.

2.2. <u>**පක්ෂ සාමාජිකත්වය**</u>

පිළිගත් දේශපාලන පක්ෂ සඳහා සාමාජිකයන් බඳවාගන්නා ක්‍රියාපටිපාටිය සහ සුදුසුකම් මෙන්ම සාමාජිකයින්ගේ අයිතිවාසිකම් සහ වගකීම් සඳහන් ව තිබිය යුතු ය.

සාමාජිකයෙකුගේ පක්ෂ සාමාජිකත්වය අහෝසිවන ආකාරය පැහැදිලි විය යුතු ය.පක්ෂයේ සාමාජිකයා ස්වෙච්ඡාවෙන් ඉල්ලා අස්වීම හැරුනු කොට සාමාජිකත්ව ගාස්තු නොගෙවීම හෝ පක්ෂයේ කටයුතු සඳහා ක්‍රියාකාරි නොවීම හෝ විෂමාචාර ක්‍රියා යන තත්ත්වයන් යටතේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා අදාළ තීරණය ගන්නා ඒකකය ඇතුළත් පක්ෂ සංවිධාන ව්‍යුහය පැහැදිලි විය යුතු ය.

එක් පක්ෂයක සාමාජිකත්වය දරන අයෙකුට තවත් පක්ෂයක සාමාජිකත්වය ලබාගත හැකි ද යන්න පැහැදිලිව දක්වා තිබිය යුතු අතර ඒ සඳහා කොන්දේසි ඇත්නම් ඒවා ද පැහැදිලිව සඳහන් කළ යුතු ය.

2.3. <u>සැමට අවස්ථාව සැලසීම</u>

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, යෞවනයන්ගේ සහභාගිත්වය සහ සීමිත අවස්ථා ඇති ප්‍රජාවන් නියෝජනය කිරීම සඳහා සාධාරණ නියෝජනයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු ය.

**3. <u>පාලනය සහ තීරණ ගැනීම</u>**

දේශපාලන පක්ෂයේ තීන්දු තීරණ ගැනීමේ දී මෙම පරිපාලන ධූරාවලියේ ව්‍යාකූලතාවයක් (පක්ෂ සංවිධාන ඒකක අතර) හෝ බලතල ක්‍රියාත්මකවන ආකාරය සම්බන්ධයෙන් පරස්පරතාවයන් මතු නොවිය යුතු ය.

පක්ෂ ව්‍යවස්ථාව තුළ පක්ෂ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ප්‍රාදේශීය ඒකකයන් ( ප්‍රාදේශීය ශාඛා , ආසන බල මණ්ඩල, දිස්ත්‍රික් බල මණ්ඩල, ජාතික බල මණ්ඩලය) ලෙස හා පක්ෂයේ අභ්‍යන්තර ධූරාවලියේ තීන්දු තීරණ ගන්නා විධායක මණ්ඩලය ,දේශපාලන මණ්ඩලය, උත්තරීතර මණ්ඩලය, යන ඒකක බලතල ධූරාවලියේ ස්ථානගතවන ආකාරය, එම ඒකක වලට ක්‍රියාත්මක කළ හැකි බල සීමාව හා එම බලය ක්‍රියාත්මක කරවන ආකාරය පැහැදිලිව හා නිශ්චිතව සඳහන් කළ යුතු ය.

පරිපාලන ව්‍යුහයට මේ එක් එක් ඒකකයට ලබා දී ඇති බලතල, සාමාජිකයින් සංඛ්‍යාව, රැස්වීම් කැඳවීමේ බලය, තීන්දු තීරණ ගැනීමේ දී සන පූර්ණය නිශ්චිතව සඳහන් කළ යුතු ය.

ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පයන්ට පටහැනි ආකාරයට පක්ෂයේ නායකයාට, පක්ෂයේ සභාපතිට හෝ පක්ෂයේ ලේකම්වරයාට පවරා ඇති සාමාජිකයන් ඉවත් කිරීමේ සහ බඳවා ගැනීමේ බලතල හා පක්ෂයේ විවිධ ඒකක වලට නිශේධ බලයෙන් පත් කිරීම හෝ ඉවත් කිරීම සිදු නොවිය යුතු අතර ඒ පිළිබඳව සෑහීමකට පත් නොවන පාර්ශ්වයන්ට ඊට අභියාචනා කළ හැකි ක්‍රමවේදයක් තිබීම මඟින් පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත විය යුතු බව.

3.1. <u>පක්ෂයේ මහ සභා රැස්වීම පැවැත්වීම</u>

සෑම වර්ෂයකම එක්වරක් හෝ මහ සභා රැස්වීම පැවැත්විය යුතුය. විශේෂිත හේතු මත එසේ කළ නොහැකි වුවහොත් වසර 2ක් තුළදී වත් නිලධාරී මණ්ඩලය තෝරාගැනීම සඳහා විනිවිදභාවයකින් යුතු නිලවරණයක් පැවැත්විය යුතුය.

නිලවරණය පැවැත්වීම පක්ෂයේ ආචාර ධර්ම සංග්‍රහයට අනුකූල විය යුතු අතර ඊට අදාළ සුදුසුකම් /නිර්ණායක පැහැදිලිව දක්වා තිබිය යුතුය.ස්වාභාවික යුක්තිය සහ සාධාරණත්වය පිළිපදිමින් රහස්‍යභාවය සහ සාධාරණත්වය සඳහා සුදුසු ඡන්ද ක්‍රමයක් භාවිතා කිරීම හෝ සාමාජිකත්වය සාධාරණ යැයි සැලකෙන වෙනත් ඕනෑම ක්‍රියාවලියක් අනුගමනය කිරීම.

නිලවරණය පැවැත්වීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා අදාළ දේශපාලන පක්ෂය විසින් ස්වාධීන කමිටුවක් හෝ ස්වාධීන යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු ය.

3.2. <u>පක්ෂ නිලධාරී මණ්ඩලය</u>

පක්ෂ නිලධාරී මණ්ඩලයට අයත් තනතුරු හා ඒ එක් එක් තනතුරට පත් කරන ආකාරය සම්බන්ධයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

3.2.1.පක්ෂයේ තනතුරු සහ ඒ තනතුරුවලට අදාළ බලතල නිශ්චිතව සඳහන් කළ යුතු ය.

3.2.2.පක්ෂයේ තනතුරුවලට පත් කරන ආකාරය සහ එම තනතුරුවල බලතල පැහැදිලිව සඳහන් කළ යුතු ය.

3.2.3. පක්ෂයේ තනතුරුවලින් ඉවත් කිරීම හා ඉවත් කිරීමේ ක්‍රමවේදය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

3.2.4. ඉවත් කිරීමේ බලය එම බලය සහිත අධිකාරිය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

3.2.5. ප්‍රධාන තනතුරු වන සභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන ඒවායින් එක් තනතුරක් සඳහාවත් කාන්තා නියෝජනයක් ඇතුළත් කළ යුතු ය.

3.2.6. පක්ෂ නිලධාරී මණ්ඩලයේ පුරප්පාඩු පුරවන ආකාරය පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.

3.3. <u>තීරණ ගැනීමේ ක්‍රියාවලිය</u>

3.3.1.තීරණ ගැනීම සඳහා විනිවිදභාවයකින් යුතු යාන්ත්‍රණයක් අනුගමනය කිරීම.

3.3.2.පක්ෂයේ තීරණාත්මක කරුණු සම්බන්ධව තීරණ ගැනීමේ දී පුළුල් සාමාජික සහභාගීත්වයන් දිරිමත් කිරීම.

3.4. <u>රැස්වීම් ක්‍රමවේදය</u>

3.4.1. <u>**විධිමත් රැස්වීම්**</u> : ජාතික, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම් සඳහා කාල පරතරයන් සඳහන් කිරීම. (උදා කාර්තුමය, ද්වි- මාසික )

3.4.2. <u>**හදිසි රැස්වීම් :**</u> හදිසි කරුණු සඳහා රැස්වීම් කැඳවන ආකාරය හා එහි දී ගනු ලබන තීරණවල බලාත්මකභාවය පිළිබඳව පැහැදිලි කළ යුතු ය.

3.4.3. <u>**වාර්ෂික මහ සභා රැස්වීම්**</u>: දේශපාලන ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ පක්ෂයේ ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම.

3.4.4. <u>**පක්ෂයේ නිලධාරී මණ්ඩලය තෝරා පත් කර ගැනීම සඳහා රැස්වීම් :**</u> නිලධාරී මණ්ඩලය තෝරා පත් කර ගැනීම සඳහා පැහැදිලි කාල රාමු සහ මාර්ගෝපදේශ ලබාදිය යුතුය. මෙහි දී කැඳවීමේ බලය ඇති ඒකකය හා තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.

3.4.5. <u>**නිත්‍ය නියෝජිත රැස්වීම් සහ පක්ෂ සමුළු :**</u> මෙම රැස්වීම් කැඳවීමේ බලය ඇත්තේ කුමන නිලධරයාටද /පක්ෂ සංවිධාන ඒකකයට ද යන්න හා එසේ කැඳවීමේ ක්‍රමවේදය පිළිබඳව පැහැදිලිව සඳහන් කළ යුතු ය.

3.4.6. මෙම සියලු රැස්වීම්වල **සවිස්තරාත්මක රැස්වීම් සටහන් සහ පැමිණීමේ වාර්තා පවත්වා ගැනීම අනිවාර්ය වන අතර** පක්ෂ මහ සමුළුවේ වාර්තාව **මසක් තුළ** මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

**4.** <u>පාලන හා මූල්‍ය කළමනාකරණය</u>

4.1. <u>මූල්‍ය වගවීම</u>

අරමුදල් කළමණාකරණය කිරීම සහ වාර්ෂික විගණන පැවැත්වීම සඳහා නීති රීති ස්ථාපිත කිරීම. අරමුදල සඳහා කුවිතාන්සි ලබාදීම මුදල් බැංකුගත කිරීම වැනි විවිධ මූල්‍ය ක්‍රම හා ඒවා විය පැහැදම් කරන්නේ නම් ඒ සඳහා පක්ෂය තුළ ඇති පරිපාලන ක්‍රමවේදය ආදී කරුණුවලට අවධානය යොමු කළ යුතු වේ. මෙම සියලු කාර්යයන් හී පක්ෂයේ සියලු දෙනාට දැනගත හැකි, පැහැදිලිව සඳහන් කරන ලද විනිවිදභාවයෙන් යුතු නිවැරදි මූල්‍ය කළමනාකරණයක් තිබිය යුතු ය.

අරමුදල් මූලාශ්‍ර පිළිබඳ විනිවිදභාවය හා අවශ්‍ය අවස්ථාවන්හී දී ප්‍රසිද්ධියේ අනාවරණය කිරීමට සඳහා නිවැරදි තොරතුරු පවත්වා ගෙන යා යුතු ය.

4.2. <u>නීතිවලට අනුකූල වීම</u>

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 8(9) උපවගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන සාමාන්‍ය හා විශේෂ විධිවිධානයන්ට සහ අදාළ වන සෙසු නීති රීති අනුව කටයුතු කළ යුතු ය.

4.3. **පක්ෂ විනය සම්බන්ධ කටයුතු**

පක්ෂ විනය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලිව හා නිරවුල්ව සඳහන් කළ යුතුය. විනය කඩ කිරීමක් ලෙස සලකනුයේ කුමන තත්ත්වයක් ද යන්නත්, එය තීරණය කරන බල අධිකාරිය කුමක් ද යන්නත් හා විනය කඩකිරීමකට අදාළ පරීක්ෂණ මොනවා ද යන්නත් පැහැදිළිව දක්වා තිබිය යුතු ය. එම පරීක්ෂණ ස්වාභාවික යුක්ති මූලධර්ම නීතියට අනුකූලව ක්‍රියාත්මකවීම වැදගත් වේ. පක්ෂ විනය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නා පක්ෂ සංවිධාන ඒකකය හා එහි ක්‍රමවේදයත්, අවසන් තීරණය ලබාදීම පිළිබඳව නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහන් කළ යුතු ය.

4.4. **වාර්තා තබා ගැනීම**

යාවත්කාලීන සාමාජික ලැයිස්තු , රැස්වීම් සටහන් සහ මූල්‍ය වාර්තා පවත්වා ගත යුතු ය.

**5. සැමට අවස්ථාව සැලසීම සහ නියෝජනය**

5.1. **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇතුළත් කිරීම :**

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතට අනුකූලව පත් කරන කාන්තා නියෝජනයට අමතරව, නායකත්ව තනතුරු සඳහා කාන්තාවන් පත් කිරීම සඳහා අවම අනුපාත නියමයක් නියම කිරීම. (උදා: - ආරම්භයේදී 25% සිට 35% දක්වා එය අවසානයේ 35% සිට 50% දක්වා වැඩි කළ හැකිය.)

වාර්ෂික සමාලෝචන හරහා ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ මිනුම් දඬුවලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම.

5.2. **තරුණ, ආබාධිත සහ ආන්තික නියෝජනය :**

තරුණ ( අවුරුදු 35 ට අඩු), ආබාධිත සහ ආන්තික කණ්ඩායම් සඳහා නායකත්ව තනතුරු වෙන් කිරීම (උදා:- 10% ක්)

5.3. **ප්‍රාදේශීය නියෝජනය:**

ප්‍රාදේශීය මට්ටමේ නියෝජනයන් දිරිමත් කළ හැකි අයුරින් සියලුම දිස්ත්‍රික්කවලින් සමානුපාතික නියෝජනය සහතික කිරීම.

**6. මැතිවරණ ක්‍රියාවලීන්**

6.1. **අපේක්ෂකයන් තේරීම:**

විනිවිදභාවයකින් යුතු ප්‍රජාතන්ත්‍රවාදී නාමයෝජනා ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.

6.2. **ප්‍රචාරක නීති**

සදාචාරාත්මක ප්‍රචාරක ප්‍රමිතීන් බලාත්මක කිරීම හා මැතිවරණ කොමිෂන් සභා විධානයන්ට හා උපමානයන්ට අවනතව ප්‍රචාරණය පවත්වාගෙන යා යුතු ය.

**7. වාර්තා කිරීම සහ අධීක්ෂණය**

7.1. වාර්ෂික වාර්තාකරණය

7.1.1. **විගණිත ගිණුම් ප්‍රකාශ නියමිත දිනට ලබා දීම**

ගිණුම් වර්ෂය ව්‍යවස්ථාවේ සඳහන් කිරීම, පක්ෂයේ ආදායම් වියදම් ක්‍රියාවලිය පැහැදිලිව සඳහන් කිරීම, ගිණුම් ප්‍රකාශය විගණනය කරන විගණකවරයා වසර මුලදී හඳුනා ගැනීම, ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ වගකීම පක්ෂ ව්‍යවස්ථාවෙන්ම භාණ්ඩාගාරිකවරයාට පැවරීම, විගණන කාර්යය තුළ පරීක්ෂා කරන ලද ලේඛන විගණන වාර්තාවේ සඳහන් කිරීම අත්‍යවශ්‍ය කාරණා ලෙස සලකනු ලැබේ.

7.1.2. **මැතිවරණ කොමිෂන් සභාවට ලබාදිය යුතු වාර්තා**

මැතිවරණ කොමිෂන් සභාවට ලබාදිය යුතු වාර්තා සම්බන්ධයෙන් පක්ෂ ලේකම්වරුන් වගකිව යුතු වේ. සෑම වසරක මුලදී ම පක්ෂයේ නිලධාරී මණ්ඩලය හා ඔවුන්ගේ දුරකථන අංක, ලිපිනයන්, ආදී තොරතුරු යාවත්කාලීන කිරීම හා එම තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවට ලබාදීම තුළින් සම්බන්ධීකරණ ගැටළු අවම කර ගැනීමට හේතුවේ.

7.1.3. **පශ්චාත් මැතිවරණ වාර්තාකරණය**

සෑම මැතිවරණයකටම පසුව තම පක්ෂයේ නියෝජනය පිළිබඳ, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, තරුණ සහභාගිත්වය ඇතුළත් මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධ තොරතුරු ඇතුලත් වාර්තාවක් මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබාදිය යුතු ය.

7.1.4. **අභ්‍යන්තර අධීක්ෂණය**

ව්‍යවස්ථාමය අනුකූලතාවය සහතික කිරීම සඳහා හා විගණනය අධීක්ෂණය සඳහා සමාලෝචන මණ්ඩලයක් ස්ථාපිත කල යුතු ය.

7.1.5. **පක්ෂ මූලස්ථානය**

සෑම පිළිගත් දේශපාලන පක්ෂයක්ම මැතිවරණ කොමිෂන් සභාව සමඟ නිරන්තර සම්බන්ධතා පැවැත්විය හැකි පක්ෂ කාර්යාල ලිපිනයක් හෝ ස්ථිර ලිපිනයක් සහිත පක්ෂ මූලස්ථානයක් තිබිය යුතු අතර, එම ලිපිනයේ වෙනස් වීමක් සිදුවුවහොත් එය මැතිවරණ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු ය

**8. දේශපාලන පක්ෂ සඳහා ආදර්ශ ව්‍යවස්ථාව**

**පූර්විකාව**

මෙම ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට සේවය කිරීමේ දී ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම ආරක්ෂා කිරීම, සෑමට අවස්ථාව සැලසීම, වගවීම සහ නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීමට (…....…. පක්ෂයේ නම…..) ඇති කැපවීම ප්‍රකාශ කරයි.

**පක්ෂය හැඳින්වීම**

1. **පක්ෂයේ නම, පක්ෂ ප්‍රතිපත්තිය, දැක්ම සහ අරමුණු** : පක්ෂයේ අනන්‍යතාවය සහ ඉලක්ක - නිර්වචනය කිරීම

| | | |
|---|---|---|
| **2. සාමාජිකත්වය** | : | සුදුසුකම්, අයිතිවාසිකම් සහ විනය ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම |
| **3. සංවිධානාත්මක ව්‍යුහය** | : | ජාතික, කලාපීය සහ ප්‍රාදේශීය ස්ථර සඳහන් කිරීම. |
| **4. නායකත්ව මැතිවරණ** | : | ප්‍රජාතන්ත්‍රවාදී සෑමට අවස්ථාව සලසන ක්‍රියාවලීන් සහතික කිරීම. |
| **5. රැස්වීම්** | : | විධිමත්භාවය සහ විනිවිද භාවය. |
| **6. මූල්‍ය කළමනාකරණය** | : | වගවීම සහ විනිවිදභාවය ආරක්ෂා කිරීම. |
| **7. ආචාරධර්ම සංග්‍රහය** | : | සදාචාරාත්මක හැසිරීම සහ විනය ප්‍රවර්ධනය කිරීම. |
| **8. සංශෝධන** | : | ව්‍යවස්ථාමය වෙනස්කම් සඳහා ක්‍රියා පටිපාටි නිර්වචනය කිරීම. |
| **9. වාර්තා කිරීම / අනුකූලතාවය** | : | විනිවිද භාවය සහ වගවීම සඳහා කැපවීම. |

**ක්‍රියාත්මක කිරීමේ පියවර;**

**1. මාර්ගෝපදේශ සංවර්ධනය** : **දේශපාලන පක්ෂ තම ව්‍යවස්ථා මෙම මූල ධර්මවලට අනුකූලව පෙළගස්වා මැතිවරණ** කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

**2. ධාරිතා වර්ධනය** : අනුකූලතාව, සැමට අවස්ථාව සැලසීම සහ පාලනය පිළිබඳ වැඩමුළු පැවැත්වීම.

**3. අනුකූලතා විගණන** : මාර්ග උපදේශනවලට අනුකූලවීම වරින් වර සමාලෝචනය කිරීම.

**4. සම්බාධක** : පිළිගැනීම හෝ අරමුදල් අත්හිටුවීම ඇතුළුව අනුකූල නොවීම සඳහා දඬුවම් ක්‍රියාත්මක කිරීම.

විනිවිද භාවයෙන්, සැමට අවස්ථාව සලසමින් සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් සහ ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කරමින් දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා ශක්තිමත් ආකාරයේ ප්‍රවේශයක් ලබාදීම.

ඇමුණුම **02**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා **26/**

මැතිවරණ කොමිෂන් සභාව

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත**
**දේශපාලන පක්ෂ පිළිගැනීම**
**2026**
**අයදුම්පත**

**1.** දේශපාලන පක්ෂයේ නම :

(සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම සඳහන් කිරීම අනිවාර්ය වේ.)

I. සිංහල - ..........................................................................................................

II. தமிழ் - ..........................................................................................................

III. English - ..........................................................................................................

**2.** යෝජිත පක්ෂ ලකුණ : ........................................................

(අංක 2471/24 හා 2026.01.13 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* (ආ) උප ලේඛනයේ සඳහන් ලකුණු අතරින් තෝරා ගත යුතු ය.)

**3.** පක්ෂ කාර්යාලයේ ලිපිනය : ..........................................................................................
..........................................................................................................................................

**4.** පක්ෂ කාර්යාලයේ දුරකථන අංකය : 4.1 ස්ථාවර : ................................
4.2 ෆැක්ස් : ................................
4.3 විද්‍යුත් ලිපිනය : ................................

**5.** පක්ෂ ලේකම්වරයාගේ නම : ..........................................................................................

**6.** පක්ෂ ලේකම්වරයාගේ ජාතික හැඳුනුම්පත් අංකය : ....................................................................

**7.** පක්ෂ ලේකම්වරයාගේ ලිපිනය : ..................................................................................................

.............................................................................................................................................

**8.** පක්ෂ ලේකම්වරයාගේ දුරකථන අංකය : ජංගම දුරකථන අංකය - ........................................

ස්ථාවර දුරකථන අංකය - .......................................

**9.** පක්ෂ ලේකම්වරයාගේ විද්‍යුත් තැපැල් ලිපිනය : .......................................................................

**10.** පක්ෂ පිළිගැනීම සඳහා මීන් පෙර ඉල්ලුම් කර තිබේ නම්,

10.1 ඉල්ලුම් කරන ලද වර්ෂය : .........................................................

10.2 ඉල්ලුම් කරන ලද පක්ෂ නාමය : .........................................................

10.3 එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබූ දිනය : .........................................................

**11.** අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ලේඛන
**(සියලු ලේඛන පිළිවෙලට අංක කර පිටපත් දෙකකින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය.)**

| *ලේඛනය* | *ඇත* | *නැත* |
|---|---|---|
| 11.1 පක්ෂ ව්‍යවස්ථාව | | |
| 11.2 පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ නම් ලැයිස්තුව | | |
| 11.3 පක්ෂයේ නිලධාරී මණ්ඩලයෙහි කාන්තා නිලධාරීන්ගේ නම් ලැයිස්තුව (වසර 04 ක) | | |
| 11.4 ලියාපදිංචි විගණකවරයකු විසින් විගණනය කරන ලද පක්ෂයට අදාළ ගිණුම් ප්‍රකාශ | | |
| 11.5 පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය | | |
| 11.6 වසර 4ක දේශපාලන ක්‍රියාකාරිත්වය සනාථ කෙරෙන තොරතුරු ඇතුළත් ගොනුව ( එක් එක් වර්ෂය සඳහා වෙන වෙනම ගොනු සකස් කර ඉදිරිපත් කළ යුතු ය.) | | |

**12**. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5)(ආ)(ii)(අ) හෝ (ආ) වගන්තිය ප්‍රකාරව පිළිගැනීම සඳහා ඉල්ලුම් කරන්නේ නම්;

12.1 මෙම පක්ෂය ස්වාධීනව හෝ සන්ධානගතව පසුගිය පාර්ලිමේන්තු මැතිවරණ සඳහා තරග කර ඇත් ද?
.......................................................................................................................

12.2 තරග කර ඇත්නම්, තරග කරනු ලැබූ මැතිවරණ කොට්ඨාස :…………………………………..

12.3 ජයග්‍රහණය කරන ලද මන්ත්‍රී ධූර සංඛ්‍යාව : ..........................................................................

12.4 සන්ධානගතව තරග කරන ලද්දේ නම්, සන්ධානගත වූ පක්ෂයේ / සන්ධානයේ නම :
..............................................................................................................................................

12.5 සන්ධානය තුළ පක්ෂයේ සාමාජිකයන් තරග කරනු ලැබ ඇත්නම්,

12.5.1 තරග කරනු ලැබූ සාමාජිකයන් සංඛ්‍යාව : ..........................................................

12.5.2 තරග කරනු ලැබූ සාමාජිකයන්ගේ තොරතුරු : ..........................................................

| *අනු අංකය* | *තරග කරන ලද සාමාජිකයාගේ නම* | *ලිපිනය* | *තරග වැදුණු දිස්ත්‍රික්කය* |
|---|---|---|---|
| i | | | |
| ii | | | |
| iii | | | |
| iv | | | |
| v | | | |
| vi | | | |
| vii | | | |
| viii | | | |

12.6 අදාළ සන්ධානගත වීමට අදාළ ලිපිය/ අවබෝධතා ගිවිසුම
(අදාළ ලිපියේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)

| ඇත | නැත |
|---|---|

.................................................................. (දේශපාලන පක්ෂය) සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලේඛන මාගේ දැනුම පරිදි සත්‍ය හා නිවැරදි බව ද මෙයින් ප්‍රකාශ කරමි.

........................................ ............................................................
දිනය ලේකම්වරයාගේ අත්සන.
නිල මුද්‍රව

EOG 01 - 0220

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.